## මැතිවරණ අයවැය පාලනය කළ හැක්කේ කාට ද?

නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍ය පුළුල් බලතල වලින් සමන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන මඟින් ස්ථාපිතව ඇති මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව මෙරටේ ජනතාව තුළ ඇත්තේ ඉමහත් ප්‍රසාදයකි. විශේෂයෙන්ම සියළුදෙනා ඇතුළත්කර ගන්නා මැතිවරණ ක්‍රියාවලියක් තහවුරු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව මෑතකාලීනව ගන්නා ලද බොහෝ ක්‍රියාමාර්ග ඉතා ප්‍රශංසාත්මකය. මේ අනුව මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ යම් නියාමනයක් කිරීමේදී මැතිවරණ කොමිෂන් සභාවට කළ හැකි කාර්යභාරය ඉමහත්ය. දැනටමත් මැතිවරණ ව්‍යාපාර මූල්‍යකරණයට අදාළ නියාමනයන් හඳුන්වාදීම තම ප්‍රමුඛතම ඉලක්ක වලින් එකක් බවට තම **උපාය මාර්ගික සැළැස්මේ** දී හඳුනාගෙන ඇත. අනාගතයේ දී සිදුකිරීමට නියමිත එවන් කාර්යයකදී නීතිපති දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වඩාත් පුළුල්ව සම්බන්ධ කර ගැනීම එහිලා ඉතා වැදගත්ය.

තවද මැතිවරණ කොමිෂන් සභාව මේ වන විටත් මැතිවරණ මූල්‍යකරණය නියාමනය කිරීම සඳහා කෙටුම්පතක් සකස් කොට ඇත. එකී කරුණ සහ තවත් මැතිවරණ ආශ්‍රිත කාලීන අභියෝග කිහිපයත් පිළිබඳ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත්කළ යුතු බවට ඔවුන් මේ වන විටත් යෝජනා කොට ඇත. මැතිවරණයක දී පිළිගත් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම්, අපේක්ෂකයන් මැතිවරණය වෙනුවෙන් දරනු ලබන වියදම් පිළිබඳව විනිවිදභාවයක් ඇති කිරීමට හා වියදම් සීමා කිරීමට අදාළව, 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනත, 1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 අධිකාරිය) යන පනත් සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත නමින් හඳුන්වා ඇත්තේ මෙකී මැතිවරණ ව්‍යාපාර වියදම් සීමා කිරීමට අදාළව මැතිවරණ කොමිෂන් සභාව සකස් කොට ඇති මූලික කෙටුම්පතයි.

***අනාවරණය කිරීම*** :

මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ඉතා වැදගත් මූලධර්මයක් වන්නේ අනාවරණයයි. මුදල් ලබාගැනීමේ මාධ්‍ය ලෙස කටයුතු කරන පාර්ශවය සහ මැතිවරණ ක්‍රමය මෙහිදී අනාවරණය කිරීමේ වගකීම දැරිය යුතුය. එහිදී අනාවරණය කරන ගිණුම්, දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයන් ස්වාධීනව විගණනය කළ යුතුය. තවද මැතිවරණ ව්‍යාපාර සඳහා පරිත්‍යාග කරන පාර්ශව වාර්තා කිරීම සඳහා දිරිගැන්වීම ද වැදගත්ය. අවශ්‍ය නම් ඊට බදු අනුබල (Incentives) පවා ලබාදීමේ වරදක් නැත. අනාවරණය කිරීමේදී ඉතා තීරණාත්මක වන්නේ ආධාර දුන්නේ කවුද, කොතරම් මුදලක් ප්‍රදානය කරන ලද්දේ ද, කවරෙක් හට කුමන පරමාර්ථයක් සඳහා ද ආදී කරුණු නිවැරදිව දැක්වීමයි. එලෙස අනාවරණය කළ යුතු කාලසීමාව කුමක්ද යන්න ගැඹුරින් සළකා බැලීම ද වටී. කෙසේ වුවත් මෙරටේ පසුවිපරම් යාන්ත්‍රණ එතරම් කාර්යක්ෂම ව ක්‍රියාකරන බවට වන විශ්වාසය ඉතා අඩු බැවින් අනාවරණය කිරීම මැතිවරණ කාලසීමාව තුළදී ම සිදු කිරීම වඩාත් ඵලදායී විකල්පයක් වනු ඇත. අවශ්‍ය වන්නේ නම් යම් ව්‍යතිරේකයන් දැක්විය හැකිය. අයර්ලන්තය, රුසියාව වැනි රටවල අනාවරණය කිරීම සිදු කළ යුත්තේ අනුමත සීමාවන් ඉක්මවා යන විටදී පමණි.

***මිත්‍යා මත*** :

- වියදම් සීමාව මඟින් පුද්ගල ප්‍රකාශන නිදහස උල්ලංඝනය වේ.
- යම් තනතුරක් දරන පුද්ගලයෙකුට ඇති පිළිගැනීම තුළ, වැඩි මුදල් ලබා ගැනීමේ අවකාශයක් ඔහුට හෝ ඇයට ඇත. ඒ නිසා වියදම් සීමාව ඔවුන්ගේ කටයුතු පහසු කරයි.
- ජනතාව වෙත පණිවුඩය ගලායාම සිදුවන්නේ මන්දගාමීවය.

ඉහත දැක්වූ බොහෝ කරුණු කිසිදු තර්කානුකූල පදනමකින් බිහි වූ ඒවා නොවේ. කවර සීමාවක් පැනවීමෙන් වුවද තවත් අයෙකු යම් වාසියක් ගැනීම සාමාන්‍ය ස්වභාවයයි. එහෙත් ඉහත මිථ්‍යා මත දුරු කළ හැකි හොඳම මාර්ගය වන්නේ එක් එක් ආසන හෝ දිස්ත්‍රික්ක තුළ තරඟ කිරීම සඳහා වැය වන මුදල පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණයක් පවත්වා ඉන් අනතුරුව සීමාවන් තීරණය කිරීමයි.

***අවස්ථා*** :

තොරතුරු දැනගැනීමේ පනත මෙරටේ බලාත්මක වී තිබීම මැතිවරණ ව්‍යාපාර වියදම් පිළිබඳ මහජන අවධානය වඩාත් පුළුල් කිරීම සඳහා යොදාගත හැකිය. එමෙන්ම දැනටමත් මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) සහ පැෆ්රල් සංවිධානය ඒකාබද්ධව මැතිවරණ මූල්‍යකරණය නියාමනය කිරීම සඳහා මූලික ලියවිල්ලක් සකස් කොට ඇත. දිවයින පුරා සංචාරය කරමින් සහ අදාළ පාර්ශව රාශියක් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව සකස් කොට ඇති මෙම ලියවිල්ල රටෙහි මූලික නීතියක් බවට පත්කිරීම ප්‍රජාතන්ත්‍රවාදය අගයන සියලු පුරවැසියන්ගේ සහ මෙරටේ ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ගේ වගකීම විය යුතුය.

***<u>වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය</u>*** :

මෙම නීතිය වඩාත් ප්‍රායෝගික තලයට ගෙනඒම සඳහා කැපවූ ක්‍රියාධරයන්ගේ අදහස වන්නේ, මෙරටේ දැනට පවත්නා බලවත් ම නීතීන් අතුරින් එකක් වන්නේ මෙය බවයි. එය ඕනෑම දේශපාලඥයෙක් පරීක්ෂා කළ හැකි කදිම මෙවලමකි. එහෙත් මෙය අද දක්වා ම මෙරටේ භාවිත වන්නේ ඉතා අක්‍රීය එකක් ලෙසිනි. එකී නීතියේ පවත්නා ආවේනික දුබලතා ඉවත්කිරීම ඉතා කාලීන අවශ්‍යතාවක් ව පවතී. තවද අපේක්ෂකයන් විසින් භාරදෙනු ලබන මෙකී ප්‍රකාශ මෙතෙක් පැවතියේ අභිරහස් ලේඛන විශේෂයක් ලෙසිනි. අදාළ පාර්ශව වෙත ලබා දෙන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඊට සමගාමීව ස්වේච්ඡාවෙන් ජනතා පරිශීලනයට විවෘත කිරීම සඳහා ඉදිරිපත් වීමට තරම් දියුණු දේශපාලන සංස්කෘතියක් බිහිකර ගැනීම අද අප හමුවේ පවත්නා තවත් ප්‍රධානතම අභියෝගයකි. ඊට අමතරව මෙකී ප්‍රකාශ ලබා ගැනීමට පමණක් නොව ඒවා ප්‍රකාශයට පත් කරමින් ඒ පිළිබඳ සමාජ කථිකාවක් ගොඩනැංවීමට අවැසි පරිසරය මෙරටේ පුරවැසියන් හට ලබා දිය යුතුය. මෑතදී සම්මත වූ තොරතුරු දැනගැනීමේ පනත මෙරටේ සමාජ හා දේශපාලන අභිවෘද්ධිය සඳහා දායක කර ගත හැකි එක් ප්‍රගතිශීලී පියවරක් වන්නේ මෙකී නිදහස ශ්‍රී ලාංකීය පුරවැසිය හට ප්‍රදානය කිරීම මඟිනි.

***<u>ඉදිරි පියවර</u>*** :

මෙරටට සර්වජන ඡන්ද අයිතිය ලැබී මේ ගෙවී යන්නේ අටවැනි දශකයයි. මැතිවරණ කිහිපයක දී මතු වූ යම් යම් සිද්ධීන් කිහිපයක් හැරුණු විට ශ්‍රී ලංකාවට අනන්‍ය වූ ඉතා සාඩම්බර මැතිවරණ ඉතිහාසයක් පවතින අතර කවර මාදිලියක හෝ මැතිවරණ ප්‍රතිසංස්කරණයකට අදාළ කරුණක් වේද එය සිදු විය යුත්තේ මෙරටට ආවේණික වූ සම්ප්‍රදායන් ගුරු කොට ගනිමිනි. මෙතෙක් ලොව කිසිදු රටක පරිසමාප්ත මැතිවරණ ක්‍රමයක් බිහි කොට නැත. ඒ අනුව මැතිවරණ ව්‍යාපාර වියදම් ද යම් නියාමනයකට නතු කළ යුත්තේ මෙරටේ වර්තමාන දේශපාලන පසුබිම පිළිබඳ පූර්ණ අවබෝධයකින් යුක්තවය. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව, දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වයෙන් සිදුවන සාකච්ඡා මාලාවක් තුළින් යම් නියාමන ක්‍රමවේදයක් සකස් විය යුතුව ඇත. එවැනි නීතිමය කාර්යයකදී පහත කරුණු කෙරෙහි ද අවධානය යොමු කිරීම වැදගත් ය.

- දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්ගේ වත්කම් හා බැරකම් වලට අදාළ මූලික කරුණු හඳුන්වාදෙනු ලබන කවර හෝ නියාමන ක්‍රමයක මූලික පදනම බවට පත්විය යුතුය.
- හඳුන්වාදෙනු ලබන කවර නියාමන ක්‍රමයක් හෝ වේවා එය දේශපාලඥයන් ඡන්දදායකයාගෙන් ඈත් කරනු ලබන්නක් නොවිය යුතුය. එවැන්නක් හරහා නිදහස් අදහස් ප්‍රකාශනයට බාධා නොපැණවීම අත්‍යාවශ්‍ය සාධකයකි.
- මුදල් යනු වගකීම් සහගත දේශපාලනයක නියැලීම සඳහා ලැබෙන වරප්‍රසාදයක් බව දේශපාලඥයන්ට ඒත්තු ගැන්විය යුතුව ඇත. ඒ අනුව ඡන්දදායකයා සහ දේශපාලඥයා යන දෙපාර්ශවයට ම එකඟවිය හැකි ක්‍රමවේදයක් දක්වා සාකච්ඡා කිරීම හා වෙනත් ජාත්‍යන්තර ක්‍රමවේද තුළ පවත්නා යහපත් පරිචයන් පිළිබඳව සළකා බැලීම ද ඉතා වැදගත්ය.

*මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාර, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය*